

# “timedLoop” ඇසුරින් ආලෝක රටාවක් හදමු



ඉහත වීඩියෝවේ දැක්වෙන ආකාරයට දැල්වෙන බල්බ රටාවක් නිර්මාණය කරමු.

මෙහිදී යොදා ගෙන ඇත්තේ එකම **image** එකකි. එම **image** එක පස් වතාවක් යොදා ගෙන ඇත. **Images** වල **size** එක හා **x, y position** එක වෙනස් කර රටාවක් ලෙස **images show** හා **hide** කිරීම මෙහිදී සිදු වේ.

මුලින් ම **“yellowCircle.png” image** එක **add** කරගෙන පහත පරිදි **Properties** සාදා ගන්න. එකම **image** එක පස් වතාවක් **add** කරගෙන ඇත.




මෙහිදී **images** වල **id** වලට, **imageA, imageB, imageC, imageD,** හා **imageE** ලෙස ලබා දෙමු. මෙලෙස ලබා දෙන්නේ **coding** වලට පහසු වීම සඳහාය. කුඩාම **image** එකට...

- ❑ **imageA** ලෙසත්, **image** වල **size** එක වැඩි වන පිළිවෙලට **imageB, imageC, imageD,** හා **imageE** ලෙස **id** ලබා දෙන්න.

- ❑ මෙහිදී සිදුවන්නේ **image** වල **size** එක වැඩි වන පිළිවෙලට **show** වීමය. මෙහිදී ප්‍රමාණය වැඩිම **imageE show** වන අවස්ථාවේ සියලු **images** තිරයේ දිස් වේ. ඉන්පසු **images** සියල්ල **hide** වීම සිදු වේ. ඒ අනුව මෙහි අවස්ථා 6 ක් තිබේ.
  - පළමු අවස්ථාවේ **imageA** පමණක් **show** වීම.
  - දෙවන අවස්ථාවේ **imageA show** වී තිබෙන විට, **imageB show** වීම.
  - තෙවන අවස්ථාවේ **imageA** හා **imageB show** වී තිබෙන විට, **imageC show** වීම.
  - හතරවන අවස්ථාවේ **imageA, imageB** හා **imageC show** වී තිබෙන විට, **imageD show** වීම.
  - පස්වන අවස්ථාවේ **imageA, imageB, imageC** හා **imageD show** වී තිබෙන විට, **imageE show** වීම.
  - හයවන අවස්ථාවේ **images** සියල්ල ම **hide** වීම.

- ❑ මේ සඳහා **"count", "result"** ලෙස **variable** දෙකක් නිර්මාණය කර අගය බිංදුව ලෙස ලබා දෙන්න.

```
var count = 0;
var result = 0;
```

- ❑ ඉන්පසු **"timedLoop"** ඇතුළේ **"count" variable** එකට 1ක් එකතු කරන්න. **"timedLoop"** එකට **250ms** ලෙස ලබා දෙන්න.

- ❑ එවිට සෑම තත්පර කාලයකදීම **"timedLoop"** එක **call** වෙයි. ඒ නිසා **count variable** එකෙහි අගය සෑම තත්පර කාලයකදීම එකකින් වැඩි වෙයි. (0, 1, 2, 3, ...)

- ❑ මෙහිදී අවස්ථා 6 ක් නිසා **count** එක, 6 න් බෙදා ඉතිරිය **result variable** එකට **assign** කර ගන්න. ඕනෑම සංඛ්‍යාවක් 6 න් බෙදූ විට ඉතිරි වන්නේ 0, 1, 2, 3, 4, 5 යන සංඛ්‍යා අතරින් එකක් වේ.

```
result = count % 6;
```

- ❑ දැන් **result variable** එකෙහි අගය අනුව පහත පරිදි **images show** වීම සිදුවිය යුතුය. (සම්පූර්ණ **code** කොටස පහත පරිදි වේ.)

```
var count = 0;
var result = 0;
timedLoop(250, centerlineFun);
function centerlineFun() {
  result = count % 6;
  if (result == 0) {
    showElement("imageA");
  } else if (result == 1) {
    showElement("imageB");
  } else if (result == 2) {
    showElement("imageC");
  } else if (result == 3) {
    showElement("imageD");
  } else if (result == 4) {
    showElement("imageE");
  } else {
    hideElement("imageA");
    hideElement("imageB");
    hideElement("imageC");
    hideElement("imageD");
    hideElement("imageE");
  }
  count = count + 1;
}
```

**result = 0 විට imageA show වීමටත්,**

**result = 1 විට imageB show වීමටත්,**

**result = 2 විට imageC show වීමටත්,**

**result = 3 විට imageD show වීමටත්,**


**result = 4 විට imageE show වීම සිදු විය යුතුයි.**

කුඩා **image** එකේ සිට පිළිවෙලින් විශාල වන ආකාරයට **images show** කරන අතර, **images show** කරන අවස්ථාවේ කිසිදු **image** එකක් **hide** නොකරයි.

**Images** සියල්ල **show** වීමටත් ඉන්පසු නැවත කුඩා **image** එකේ සිට **image show** වී රටාව සිදු වීමටත් **images** සියල්ල **hide** වී නැවත කුඩා **image** එකේ සිට රටාව ආරම්භ විය යුතුය. **result = 5** විට එනම් **else part** එකේදී **images** සියල්ලම **hide** වීම සිදු විය යුතු වේ.

අභ්‍යාසය

1. තවත් **screen** එකක් ගෙන එයට පින්තූර එකතුවේ ඇති කැමති වර්ණයක රූපයක් ඇතුළත් කර මෙම වීඩියෝවේ දැක්වෙන රටාව ලැබෙන සේ කෝඩ්ස් සකසන්න.



එහිදී විශාල **image** එකේ සිට පිළිවෙලින් කුඩා වන ආකාරයට **images show** කරන අතර, **images show** කරන අවස්ථාවේ කිසිදු **image** එකක් **hide** නොකරයි.